# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1980 අංක 26 දරන
# ආහාර පනත

[සහතිකය සටහන් කළේ 1980 ජූලි මස 17 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

1980 ජූලි මස 25 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

මිල : රු. 1.30 යි    තැපැල් ගාස්තුව : ශත 75 යි

# 1980 අංක 26 දරන ආහාර පනත

[සහතිකය සටහන් කළේ 1980 ජූලි මස 17 වන දින]

එල්. ඩී.—ඕ. 61/78

**ආහාර නිෂ්පාදනය, ආනයනය, විකිණීම සහ බෙදා හැරීම විධිමත් කිරීම සහ පාලනය කිරීම පිණිස සහ ආහාර උපදේශක කමිටුවක් පිහිටුවීම පිණිස ද ආහාර සහ ඖෂධ පනත (216 වන අධිකාරය) ඉවත් කිරීම පිණිස ද ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත 1980 අංක 26 දරන ආහාර පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන දිනයක එය ක්‍රියාත්මක වන්නේ ය. *ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වීමේ දිනය.*

## I වන කොටස

### ආහාර සම්බන්ධයෙන් වූ තහනම් කිරීම

**2.** (1) (අ) යම් ආහාරයක් තුළ හෝ මත, එම ආහාරය සෞඛ්‍යයට හානිකර බවට පත් කරන යම් ස්වාභාවික හෝ එක් කළ අනර්ථදායක ද්‍රව්‍යයක් ඇත් ද එවැනි ආහාරයක් නිෂ්පාදනය කිරීම, ආනයනය කිරීම, විකිණීම හෝ බෙදා හැරීම ; *ආහාර නිෂ්පාදනය, ආනයනය, විකිණීම සහ බෙදාහැරීම සම්බන්ධයෙන් වූ තහනම් කිරීම.*

(ආ) මනුෂ්‍ය පරිභෝජනයට නුසුදුසු යම් ආහාරයක් නිෂ්පාදනය කිරීම, ආනයනය කිරීම, විකිණීම හෝ බෙදා හැරීම ;

(ඇ) යම් අපවිත්‍ර, කුණු වූ, පිළිකුල්, දිරාපත් වූ, නරක් වූ හෝ රෝගග්‍රස්ථ සත්ව ද්‍රව්‍යයකින් හෝ දිරාපත් වූ වෘක්ෂ ද්‍රව්‍යයකින් හෝ සම්පූර්ණයෙන් ම හෝ කොටසකින් හෝ සංයුක්ත වන හෝ කෘමි සතුන් ගහණ ආහාරයක් නිෂ්පාදනය කිරීම, ආනයනය කිරීම, විකිණීම හෝ බෙදා හැරීම ;

(ඈ) බාල කළ ආහාරයක් නිෂ්පාදනය කිරීම, ආනයනය කිරීම, විකිණීම හෝ බෙදා හැරීම ;

(ඉ) යම් ආහාරයක් තුළ හෝ මත මේ පනතේ හෝ එය යටතේ සාදන ලද යම් නියෝගයක හෝ විධිවිධාන කඩ කරමින් යම් ද්‍රව්‍යයක් එකතු කර ඇත් ද එවැනි ආහාරයක් නිෂ්පාදනය කිරීම, ආනයනය කිරීම, විකිණීම හෝ බෙදා හැරීම ; හෝ

(ඊ) මේ පනතේ විධිවිධාන හෝ එය යටතේ සාදන ලද යම් නියෝගයක් හෝ කඩ කරමින් යම් ආහාරයක් නිෂ්පාදනය කිරීම, ආනයනය කිරීම, විකිණීම හෝ බෙදා හැරීම

කිසිම තැනැත්තකු විසින් නොකළ යුතු ය.

2—එ 49140–13,000 (80/04)

(2) යම් ආහාරයක් විකිණීම සඳහා සනීපාරක්ෂාවට අහිතකර තත්ත්වයන් යටතේ නිෂ්පාදනය කිරීම, සූදානම් කිරීම, පරිරක්ෂණය කිරීම, ඇසිරීම, හෝ ගබඩා කිරීම කිසිම තැනැත්තකු විසින් නොකළ යුතු ය.

(3) විකිණීම සඳහා, සනීපාරක්ෂාවට අහිතකර තත්ත්වයන් යටතේ නිෂ්පාදනය කළ, සූදානම් කළ, පරිරක්ෂණය කළ, ඇසුරු හෝ ගබඩා කළ යම් ආහාරයක් ආනයනය කිරීම, විකිණීම හෝ බෙදාහැරීම කිසිම තැනැත්තකු විසින් නොකළ යුතු ය.

**ලේබල් කිරීම, ඇසිරීම, ප්‍රචාරය කිරීම.**

3. (1) යම් ආහාරයක, එහි ස්වභාවය, අගය, තත්ත්වය, සංයුතිය, ගුණය හෝ ආරක්ෂා සහිත භාවය සම්බන්ධයෙන් අසත්‍ය, නොමඟ යවන සුළු, රැවටෙන හෝ වැරදි හැඟීමක් ඇති විය හැකි ආකාරයකින් එම ආහාරය ලේබල් කිරීම, ඇසිරීම, පදම් කිරීම, සකස් කිරීම, විකිණීම හෝ ප්‍රචාරය කිරීම කිසිම තැනැත්තකු විසින් නොකළ යුතු ය.

(2) මේ පනත යටතේ සාදන ලද නියෝගවලින් නියමිත ආකාර යට ලේබල් නොකර හෝ අසුරා නොමැති හෝ එවැනි නියෝගවලට පටහැනිව ලේබල් කර ඇති හෝ අසුරා ඇති යම් ආහාරයක් (1) වන උපවගන්තියට පටහැනිව ලේබල් කර ඇති ලෙස හෝ අසුරා ඇති ලෙස සැලකිය යුතු ය.

**ප්‍රමිතියක් නියම කර ඇති අවස්ථාවක දී.**

4. යම් ආහාරයක් සඳහා ප්‍රමිතියක් නියම කර ඇති අවස්ථාවක, එම ප්‍රමිතියට ප්‍රස්තුත වූ ආහාරය යයි වරදවා තේරුම් යා හැකි ආකාරයට, එම ප්‍රමිතියට අනුකූල නොවන යම් ආහාරයක් ලේබල් කිරීම, ඇසිරීම, විකිණීම හෝ ප්‍රචාරය කිරීම කිසිම තැනැත්තකු විසින් නොකළ යුතු ය.

**මනුෂ්‍ය පරිභෝජනයට නුසුදුසු වූ ආහාර, මනුෂ්‍ය පරිභෝජනයට හැර වෙනත් කාර්ය සඳහා විකිණීම.**

5. නරක් වූ හෝ මනුෂ්‍ය පරිභෝජනයට නුසුදුසු වූ යම් ආහාර යක් සත්ව ආහාර වශයෙන් හෝ වෙනත් කාර්ය සඳහා හෝ විකිණීමට ඉදිරිපත් කිරීම, විකිණීමට තැබීම හෝ විකිණීම, ප්‍රධාන ආහාර බලධරයාගේ හෝ තත් කාර්යය සඳහා ඔහු විසින් ලියවිල්ලකින් බලය දෙන ලද වෙනත් තැනැත්තකුගේ අවසරය ඇතිව ද ඒ බලධරයා හෝ තැනැත්තා විසින් නිකුත් කරන ලද විධානවලට අනුකූලව ද මිස, කිසිම තැනැත්තකු විසින් නොකළ යුතු ය.

**ප්‍රතිඥා භාරය.**

6. (1) යම් ආහාරයක් නිෂ්පාදනය කරන්නකු හෝ බෙදා හරින්නකු හෝ එම ආහාර වෙළෙන්දකු හෝ එම ආහාරයේ කොමිස් නියෝජිතයකු විසින් ඒ ආහාරය යම් විකුණුම්කරුවකුට විකිණීම, එම ආහාරයේ ස්වභාවය, ද්‍රව්‍යය සහ තත්ත්වය සම්බන්ධ යෙන් නියමිත ආකෘතියේ වූ ප්‍රතිඥා භාරයක් ද ඒ විකුණුම්කරුට දෙන්නේ නම් මිස, නොකළ යුතු ය.

(2) එවැනි යම් ආහාරයක් නිෂ්පාදනය කරන්නකු හෝ බෙදා හරින්නකු හෝ එම ආහාර වෙළෙන්දකු හෝ එම ආහාරයේ කොමිස් නියෝජිතයකු විසින් එම ආහාරය විකිණීම වෙනුවෙන් විකුණුම් කරුවකුට දෙන ලද යම් බිල්පත්‍රයක්, මුදල් මැමයක් හෝ

ඉන්වොයිසියක්, එම විකුණන ලද ආහාරයේ ස්වභාවය, ද්‍රව්‍යය සහ තත්ත්වය සම්බන්ධ විස්තරයක් එම බිල්පත්‍රයේ, මුදල් මැම්යේ හෝ ඉන්වොයිසියේ අඩංගු වෙයි නම්, එම ආහාරය වෙනුවෙන් මේ උප වගන්තියේ පූර්වයෙන් වූ විධිවිධාන යටතේ දෙන ලද ප්‍රතිඥා භාර යක් ලෙස සැලකිය යුතු ය.

(3) යම් ආහාරයක් නිෂ්පාදනය කරන්නකු හෝ බෙද හරින්නකු හෝ කොමිස් නියෝජිතයකු හෝ වෙළෙන්දකු විසින්, අසත්‍ය ප්‍රතිඥා භාරයක් (1) වන උපවගන්තිය යටතේ නොදිය යුතු ය.

7. (1) යම් ස්ථානයක යම් ආහාරයක් නිෂ්පාදනය කිරීම, සකස් කිරීම, පරිරක්ෂණය කිරීම, ඇසිරීම, ගබඩා කිරීම හෝ විකිණීම, එම ස්ථානය සඳහා බලපත්‍ර නිකුත් කරන බලධරයා විය යුතු අදාළ ආහාර බලධරයා විසින් බලපත්‍ර නිකුත් කරනු ලැබ ඇත්නම් මිස, කිසිම තැනැත්තකු විසින් නොකළ යුතු ය. බලපත්‍ර නිකුත් කිරීම.

(2) ආහාර නිෂ්පාදනය කිරීමට, සකස් කිරීමට, පරිරක්ෂණය කිරීමට, ඇසිරීමට, ගබඩා කිරීමට හෝ විකිණීමට තමාට බලය දෙන බලපත්‍රයක් දරන්නකු වන්නේ නම් මිස ද එවැනි බලපත්‍ර යක නියමයන් සහ කොන්දේසිවලට අනුකූලව ද මිස, යම් ආහාර යක් නිෂ්පාදනය කිරීම, සකස් කිරීම, ගබඩා කිරීම හෝ විකිණීම හෝ බෙදා හැරීම කිසිම තැනැත්තකු විසින් නොකළ යුතු ය.

## II වන කොටස

## පරිපාලනය

8. (1) ආහාර උපදේශක කමිටුව යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු කමිටුවක් විය යුතු අතර එය පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය :— ආහාර උපදේශක කමිටුව.

(අ) කමිටුවේ සභාපති විය යුතු, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා ;

(ආ) කමිටුවේ ලේකම් විය යුතු, ආහාර පාලන කටයුතු පරිපාලනය භාරව සිටින සහකාර සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා ;

(ඇ) රජයේ රසපරීක්ෂකවරයා හෝ ඔහු විසින් නම් කරන ලද නිලධරයෙක් ;

(ඈ) කොළඹ මහා නාගරිකයේ නාගරික රසපරීක්ෂකවරයා ;

(ඉ) ප්‍රධාන රේගු අයකැමි හෝ ඔහු විසින් නම් කරන ලද යම් නිලධරයෙක් ;

(ඊ) කොළඹ මහා නාගරිකයේ ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිලධරයා ;

(උ) (i) ආහාර විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ, ඒ අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන, නියෝජිත යෙක් හෝ ඒ අමාත්‍යාංශය යටතේ වූ යම් දෙපාර්ත මේන්තුවක, ඒ අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන, නියෝජිතයෙක් ;

(ii) වෙළෙඳ විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ, ඒ අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන, නියෝජිත යෙක් හෝ ඒ අමාත්‍යාංශය යටතේ වූ යම් දෙපාර්ත මේන්තුවක, ඒ අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන නියෝජිතයෙක් ;

(iii) පළාත් පාලන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ, ඒ අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන, නියෝජිතයෙක් හෝ ඒ අමාත්‍යාංශය යටතේ වූ යම් දෙපාර්තමේන්තුවක, ඒ අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන නියෝජිතයෙක් ;

(ඍ) කර්මාන්ත විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන, ලංකා ප්‍රමිති කාර්යාංශයේ නියෝජිතයෙක් ;

(එ) අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන වෛද්‍ය පර්යේෂණායතනයේ පෝෂණ විද්‍යාඥයෙක් ;

(ඒ) අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන ආහාර ශිල්පඥයෙක් ;

(ඔ) අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන ආහාර විද්‍යාව පිළිබඳ විශේෂඥයන් දෙදෙනෙක් ;

(ඕ) වාණිජ පරමාර්ථ නියෝජනය කළ යුතු එක් සාමාජිකයකු ද කාර්මික පරමාර්ථ නියෝජනය කළ යුතු තවත් සාමාජිකයකු වශයෙන්, අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන සාමාජිකයන් දෙදෙනෙක් ;

(ක) පාරිභෝගිකයන්ගේ සම්බන්ධතා නියෝජනය කිරීම සඳහා අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන සාමාජිකයන් දෙදෙනෙක් ; සහ

(ග) ප්‍රධාන ආහාර සහ ඖෂධ පරීක්ෂක.

(2) (1) වන උපවගන්තියේ (ඒ), (ඔ), (ඕ) සහ (ක) ඡේද යටතේ අමාත්‍යවරයා විසින් නම් කරන ලද සෑම සාමාජිකයෙක් ම, ඉල්ලා අස්වීමෙන්, මරණයෙන් හෝ ධූරයෙන් ඉවත් කරනු ලැබීමෙන් ඔහුගේ ධූරය හිස් වුවහොත් මිස, ඔහු නම් කරනු ලැබීමේ දිනයේ සිට අවුරුදු තුනක කාල පරිච්ඡේදයක් ධූරය දැරිය හැකි අතර ඔහු නැවත නම් කරනු ලැබීමට සුදුස්සෙක් වන්නේ ය.

(3) (2) වන උපවගන්තියේ සඳහන් කර ඇති සාමාජිකයන් හැර, කමිටුවේ සෑම සාමාජිකයකුම, කමිටුවේ සාමාජිකයකු වීමට හෝ කමිටුවේ සාමාජිකයකු වශයෙන් නම් කරනු ලැබීමට ඔහුට සුදුසුකම ලැබුණු, ධූරය දැරීම නතර වූ විට, කමිටුවේ සාමාජිකයකුව සිටීම අවසන් වන්නේ ය.

(4) කමිටුවේ සාමාජිකයන්ගේ යම් පුරප්පාඩුවක් තිබුණ ද කමිටුව විසින් ස්වකීය කර්තව්‍යයන් ඉටු කළ හැකි ය.

(5) කමිටුවේ යම් රැස්වීමක් සඳහා ගණපූරණය කමිටුවේ සාමාජිකයන් හත් දෙනකුගෙන් සමන්විත විය යුතු ය.

(6) මේ පනතේ විධිවිධානවලට යටත්ව, කමිටුවේ රැස්වීම් සහ එම රැස්වීම්වල දී කටයුතු ඉටු කිරීම සම්බන්ධයෙන් කමිටුවේ කාර්ය පටිපාටිය කමිටුව විසින් ම විධිමත් කර ගත හැකි ය.

ආහාර උපදේශක කමිටුවේ කාර්ය.

9. (1) මේ පනත ක්‍රියාත්මක කිරීමේ දී මතුවන සියළුම කාරණා ගැන අමාත්‍යවරයාට උපදෙස් දීම ද මේ පනත යටතේ එම කමිටුවට පවරනු ලබන වෙනත් කර්තව්‍යයන් ඉටු කිරීමට ද ආහාර උපදේශක කමිටුවේ කාර්යය වන්නේ ය.

(2) කමිටුව විසින් නියම කරනු ලබන කොන්දේසි කිසිවක් වේ නම් ඒ කොන්දේසිවලට යටත්ව, කමිටුව විසින් උප කමිටුවලට නියෝජනය කරනු ලැබිය හැකි බලතල, ක්‍රියාත්මක කිරීම, කාර්ය හෝ කර්තව්‍ය ඉටු කිරීම සඳහා, කමිටුව සුදුසු යයි අදහස් කරනු

ලබන උප කමිටු, කමිටුව විසින් පත් කළ හැකි අතර මේ උප කමිටුවලට කමිටුවේ සාමාජිකයන් නොවන තැනැත්තන් පත් කරනු ලැබිය හැකි ය.

10. (1) (4) වන උපවගන්තියේ අන්‍යාකාර විධිවිධාන සලස්වා ඇති ආකාරයට හැර, පළාත් පාලන ආයතනයක සෑම පරිපාලන ප්‍රදේශයක් සඳහා ම, මේ පනතේ විධිවිධාන සහ එය යටතේ සාදන ලද නියෝග ඒ ඒ පළාත් පාලන ආයතනයේ පරිපාලන ප්‍රදේශය තුළ ක්‍රියාවෙහි යෙදවීම සහ බලාත්මක කිරීම සඳහා, ආහාර බලධර යකු සිටිය යුතු ය. ආහාර බලධරයා.

(2) (අ) මහා නාගරිකයක පරිපාලන ප්‍රදේශය සඳහා (1) වන උපවගන්තිය යටතේ වූ ආහාර බලධරයා වන්නේ ඒ ප්‍රදේශය සඳහා සංස්ථාපනය කරන ලද මහ නගර සභාව ය;

(ආ) වෙනත් පළාත් පාලන ආයතනයක පරිපාලන ප්‍රදේශය සඳහා (1) වන උපවගන්තිය යටතේ ආහාර බලධරයා වන්නේ—

(i) පළාත් පාලන විෂයය භාර අමාත්‍යවරයාගේ නිර්දේශය මත අමාත්‍යවරයා විසින් එම ප්‍රදේශය සඳහා ආහාර බලධරයා ලෙස ඒ ප්‍රදේශය සඳහා සංස්ථාපනය කර ඇති පළාත් පාලන ආයතනය පත් කරනු ලැබ ඇති අවස්ථාවක, ඒ පළාත් පාලන ආයතනයයි; හෝ

(ii) (i) වන අනුඡේදය යටතේ ඒ ප්‍රදේශය සඳහා ආහාර බලධරයා වශයෙන් ඒ ප්‍රදේශය සඳහා සංස්ථාපනය කර ඇති පළාත් පාලන ආයතනය පත් කර නැති අවස්ථාවක, ඒ ප්‍රදේශය සඳහා වූ සෞඛ්‍ය වෛද්‍ය නිලධරයා ය.

(3) සෑම සෞඛ්‍ය සේවා අධිකාරිවරයකු ම, තමා පත් කරනු ලැබ සිටින්නේ යම් ප්‍රදේශයක් සඳහා ද, ඒ ප්‍රදේශය තුළ (1) වන උපවගන්තිය යටතේ වූ ආහාර බලධරයන්ගේ කටයුතු අධීක්ෂණය කිරීම ද, ඒකාබද්ධ කිරීම ද කළ යුතු ය.

(4) (අ) සුරාබදු ආඥාපනතේ අර්ථානුකූලව සුරාබද්දට යටත් ආහාර සම්බන්ධයෙන්, සුරාබදු කොමසාරිස්වරයා සෑම පළාත් පාලන ආයතනයක ම, පරිපාලන ප්‍රදේශය සඳහා ආහාර බලධරයෙක් වන්නේ ය;

(ආ) මේ පනත යටතේ ආනයනය කිරීම තහනම් කරනු ලැබ ඇති ආහාර සම්බන්ධයෙන්, ප්‍රධාන රේගු අයකැමි සෑම පළාත් පාලන ආයතනයක ම පරිපාලන ප්‍රදේශය සඳහා ආහාර බලධරයෙක් වන්නේ ය:

එසේ වුවද මේ පනත යටතේ ආහාර බලධරයකු වශයෙන් ප්‍රධාන රේගු අයකැමි වෙත පැවරී ඇති බලතල සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා විසින් නම් කරනු ලැබ ඇති යම් නිලධරයකුට ප්‍රධාන රේගු අයකැමි විසින් පැවරිය හැකි ය.

ප්‍රධාන ආහාර බලධරයා.

**11.** (1) සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා මේ පනතේ කාර්ය සඳහා ප්‍රධාන ආහාර බලධරයා වන්නේ ය.

(2) 10 වන වගන්තිය යටතේ වූ සියලු ආහාර බලධරයන් අධීක්ෂණය කිරීම ද, ඔවුන්ට මඟ පෙන්වීම ද ඔවුන්ගේ කටයුතු ඒකාබද්ධ කිරීම ද ප්‍රධාන ආහාර බලධරයා විසින් කළ යුතු ය.

(3) මේ පනතේ විධිවිධාන හෝ එය යටතේ සාදන ලද යම් නියෝග සියල්ලම හෝ ඉන් යමක් ක්‍රියාවේ යෙදවීම සහ බලාත්මක කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය යයි සලකනු ලබන විධාන ප්‍රධාන ආහාර බලධරයා විසින් යම් ආහාර බලධරයකුට දිය හැකි අතර එසේ විධාන ලැබූ සෑම ආහාර බලධරයෙක් ම ඒ විධානවලට අනුකූල ව ක්‍රියා කළ යුතු ය.

(4) මේ පනත යටතේ තමාගේ බලතල සියල්ලම හෝ ඉන් යමක් හෝ ප්‍රධාන ආහාර බලධරයා විසින් අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව යම් යටත් නිලධරයකුට නමින් හෝ නිලයෙන් පැවරිය හැකි ය.

පළාත් පාලන ආයතනයක් විසින් පැහැර හැරීම.

**12.** මේ පනතේ යම් විධිවිධානයක් හෝ එය යටතේ සාදන ලද යම් නියෝග හෝ ප්‍රධාන ආහාර බලධරයා විසින් නිකුත් කරන ලද යම් විධානයක්, යම් පළාත් පාලන ආයතනයක් විසින් ඒ පළාත් පාලන ආයතනයේ පරිපාලන ප්‍රදේශය සඳහා ආහාර බලධරයා වශයෙන් ක්‍රියාවේ යෙදවීම, බලාත්මක කිරීම හෝ ඊට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හැර ඇති බවට ප්‍රධාන ආහාර බලධරයා වාර්තා වක් එවූ විට, ඊට විරුද්ධව හේතු දැක්වීමට එම පළාත් පාලන ආයතනයට අවස්ථාවක් දීමෙන් පසුව, අමාත්‍යවරයා, ඒ පළාත් පාලන ආයතනය විසින් ඒ පැහැර හැරීම කර ඇති බවටත් එය පොදු මහජන යහපත කෙරෙහි බලපාන බවටත් සෑහීමට පත් වූ අවස්ථාවක, අමාත්‍යවරයා විසින් පළාත් පාලන විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, ඒ විධිවිධානය හෝ විධානය ක්‍රියාවේ යෙදවීමට, බලාත්මක කිරීමට හෝ ඊට අනුකූලව ක්‍රියා කිරීමට ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් ප්‍රධාන ආහාර බලධරයාට බලය දිය හැකි ය.

බලයලත් නිලධරයා.

**13.** (1) යම් සෞඛ්‍ය වෛද්‍ය නිලධරයකු, ආහාර සහ ඖෂධ පරීක්ෂකවරයකු, ආහාර පරීක්ෂකවරයකු, මහජන සෞඛ්‍ය පරීක්ෂක වරයකු ද, මාංශ පරීක්ෂා කිරීම සහ තහනම් කිරීම සම්බන්ධයෙන් යම් පශු වෛද්‍යවරයකු ද ආහාර බලධරයකුගේ බලය ලත් නිලධරයකු වශයෙන් අමාත්‍යවරයා විසින් අනුමත කළ හැකි ය.

(2) සුරාබදු කොමසාරිස්වරයා හෝ ප්‍රධාන රේගු අයකැමි හෝ ආහාර බලධරයා වන අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි, සුරාබදු කොමසාරිස්වරයා හෝ ප්‍රධාන රේගු අයකැමි විසින් ලියවිල්ලකින් බලය දෙන ලද යම් තැනැත්තෙක් ඒ ආහාර බලධරයාගේ බලය ලත් නිලධරයා වන්නේ ය.

(3) මේ පනත යටතේ ස්වකීය කර්තව්‍යයන් ඉටු කිරීමේ කාර්ය සඳහා සෑම බලය ලත් නිලධරයකු විසින් ම, 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතෙහි ප්‍රකාර පොලිස් නිලධරයකුගේ බලතල ක්‍රියාත්මක කළ යුතු ය.

බලය ලත් නිලධරයාගේ බලතල.

14. (1) තමාගේ කාර්ය ඉටු කිරීම සඳහා සහ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා බලය ලත් නිලධරයකු විසින් පහත සඳහන් කටයුතු කළ හැකි ය :—

(අ) යම් භාණ්ඩයක් නිෂ්පාදනය කරන, සකස් කරන, පරිරක්ෂණය කරන, අසුරන හෝ ගබඩා කර තබන බවට ඔහු විශ්වාස කරන යම් ස්ථානයකට කවර හෝ සාධාරණ වේලාවක දී ඇතුළු වී ඒ යම් භාණ්ඩයක් පරීක්ෂා කිරීම හා එහි සැම්පලයක් ගැනීම ද එම භාණ්ඩය නිෂ්පාදනය කිරීම, සකස් කිරීම, පරිරක්ෂණය කිරීම, ඇසිරීම හෝ ගබඩා කිරීම සඳහ පාවිච්චි කරනු ලැබේ යයි ඔහු විශ්වාස කරන කවර හෝ දෙයක් පරීක්ෂා කිරීම ද කළ හැකි ය;

(ආ) යම් භාණ්ඩයක් ප්‍රවාහනය කරන බවට ඔහු විශ්වාස කරන යම් වාහනයක්, සෝදිසි කිරීමේ කාර්යය සඳහා නැවැත්වීම හෝ රඳවා තබා ගැනීම ද, එම වාහනය සෝදිසි කර එම භාණ්ඩය පරීක්ෂා කර එහි සැම්පල් ගැනීම ද කළ හැකි ය;

(ඇ) යම් භාණ්ඩයක් අඩංගු ගහි ඔහු විශ්වාස කරන යම් භාජන යක් හෝ ඇහුරුමක් විවෘත කර පරීක්ෂා කළ හැකි ය;

(ඈ) ඒ බලය ලත් නිලධරයා සෞඛ්‍ය වෛද්‍ය නිලධරයකු හෝ සුරාබදු කොමසාරිස්වරයා විසින් නැතහොත් ප්‍රධාන රේගු අයකැමි විසින් 13(2) වන වගන්තිය යටතේ බලය දෙන ලද නිලධරයකු හෝ වන අවස්ථාවක, යම් භාණ්ඩයක් සම්බන්ධයෙන් මේ පනත ක්‍රියාවේ යෙදවීම හෝ බලාත්මක කිරීමට අදාළ යම් තොරතුරක් අඩංගු බවට ඔහු විශ්වාස කරන (අ) ඡේදයේ සඳහන් යම් ස්ථානයක තිබී හමුවන යම් පොත්, ලේඛන හෝ ලේඛනගත වාර්තා පරීක්ෂා කිරීම, එහි පිටපත් ගැනීම හෝ එයින් උධෘත ලබා ගැනීම; සහ

(ඉ) යම් භාණ්ඩයක් උපකාර කරගෙන හෝ යම් භාණ්ඩයක් සම්බන්ධයෙන් හෝ මේ පනතේ යම් විධිවිධානයක් හෝ එය යටතේ සාදන ලද යම් නියෝගයක් උල්ලංඝනය කර හෝ කඩකර ඇත්තේ යයි ඔහු විශ්වාස කරයි ද ඒ භාණ්ඩය තහනමට ගෙන අවශ්‍ය විය හැකි කාලයක් රඳවා තබා ගැනීම.

(2) මේ වගන්තියේ ද 15 වන වගන්තියේ ද කාර්ය සඳහා "භාණ්ඩය" යන්නෙන —

(අ) යම් මළ සත්වයකු, කුරුල්ලකු හෝ මාළුවකු සම්පූර්ණ යෙන් ම හෝ ඉන් කොටසක් ද ඇතුළු ව, මනුෂ්‍ය පරිභෝජනය සඳහා පාවිච්චියට ගැනීමට අදහස් කර ඇති හෝ ඒ සඳහා යොදා ගත හැකි කවර හෝ ආහාරයක් අදහස් වේ;

(ආ) ආහාර නිෂ්පාදනය, සකස් කිරීම, පරිරක්ෂණය කිරීම, ඇසිරීම හෝ ගබඩා කිරීම සඳහා පාවිච්චි කරන හෝ පාවිච්චි කළ හැකි යම් දෙයක් අදහස් වේ;

(ඇ) ලේබල් ගැසීමේ හෝ ප්‍රචාරය කිරීමේ යම් ද්‍රව්‍යයක් අදහස් වේ.

(3) මේ වගන්තිය යටතේ ක්‍රියා කරන බලය ලත් නිලධරයකු ගෙන් තමාගේ බල කඩදාසිය ඉදිරිපත් කරන ලෙස නියම කරනු ලැබුවහොත් එය ඉදිරිපත් කළ යුතු ය.

(4) බලය ලත් නිලධරයකු (1) වන උපවගන්තිය යටතේ ඇතුළු වූ යම් ස්ථානයක අයිතිකරු හෝ ඒ ස්ථානය භාරව සිටින තැනැත්තා ද එහි සිට සම්බවන සෑම තැනැත්තකු ද තමාගේ ශක්ති පමණින් හැකි සෑම සාධාරණ සහයෝගයක් ම බලය ලත් නිලධරයාට දිය යුතු අතර සපයන ලෙස ඒ නිලධරයා විසින් නියම කරනු ලබන තොරතුරු ද සැම්පල් ද ඔහුට සැපයිය යුතු ය.

(5) මේ පනත යටතේ හෝ එය යටතේ සාදන ලද නියෝග යටතේ තම බලතල ක්‍රියාත්මක කිරීමෙහි යෙදී සිටින බලය ලත් නිලධරයකුට බාධා කිරීම කිසිම තැනැත්තකු විසින් නොකළ යුතු ය.

(6) විකිණීමට තබා ඇති යම් ආහාරයක සැම්පල් යම් බලය ලත් නිලධරයකු ඉල්ලා සිටියහොත් එම ආහාර විකිණීමට තබාගෙන සිටින තැනැත්තා ඒ බලය ලත් නිලධරයාට එයින් අවශ්‍ය විය හැකි ප්‍රමාණයක් විකිණීම ප්‍රතික්ෂේප කළහොත් හෝ සැම්පල් වශයෙන් ලබා ගැනීමට ඒ නිලධරයාට බලය ඇති ප්‍රමාණය ගැනීමට ඒ නිලධරයාට ඉඩ දීම ප්‍රතික්ෂේප කළහොත්, එසේ ප්‍රතික්ෂේප කරන තැනැත්තා බලය ලත් නිලධරයකුට බාධා කළ සේ (5) වන උපවගන්තියේ කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය.

(7) මේ පනත යටතේ හෝ එය යටතේ සාදන ලද නියෝග යටතේ තම බලතල ක්‍රියාත්මක කිරීමෙහි නිරතව සිටින යම් බලය ලත් නිලධරයකුට අසත්‍ය හෝ නොමග යවන සුළු ප්‍රකාශයක් වාචිකව හෝ ලිඛිතව කිසිම තැනැත්තකු විසින් දැන දැනම නොකළ යුතු ය.

(8) සෑම ආහාර විකුණන්නකුම ඔහු ආහාර මිල දී ගත්තේ යම් තැනැත්තකුගෙන් ද ඒ තැනැත්තාගේ නම, ලිපිනය සහ නියම කරනු ලැබිය හැකි එවැනි වෙනත් විස්තර බලය ලත් නිලධරයාට හෙළි කරන ලෙස නියම කරනු ලැබුවහොත් ඒ කරුණු හෙළි කළ යුතු ය.

(9) බලය ලත් නිලධරයකු විසින් මේ පනත යටතේ තහනමට ගත් යම් ආහාරයක්, එම බලය ලත් නිලධරයාගේ බලය නොමැතිව ඉවත් කිරීම, වෙනස් කිරීම, එය අයුතු ලෙස වෙනස් කිරීම හෝ කවර ආකාරයකින් එයට අයුතු යමක් කිරීම කිසිම තැනැත්තකු විසින් නොකළ යුතු ය.

(10) මේ පනත යටතේ තහනමට ගත් යම් ආහාරයක් බලය ලත් නිලධරයාගේ කැමැත්ත අනුව එය තහනමට ගත් ගොඩනැගිල්ල තුළ හෝ ස්ථානය තුළ තැබීම හෝ ගබඩා කිරීම නැත හොත් ඔහුගේ අභිමතය පරිදි වෙනත් යම් ස්ථානයකට ඉවත් කිරීම හෝ කළ හැකි ය.

(11) මේ පනත යටතේ කරන ලද යම් තහනමට ගැනීමක් ගැන බලය ලත් නිලධරයා විසින් අදාළ ආහාර බලධරයාට නොපමාව දැනුම් දිය යුතු ය.

තහනමට ගත් භාණ්ඩ සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය.

15. (1) යම් භාණ්ඩයකට අදාළව වරදක් සිදු කර ඇති විටක, බලය ලත් නිලධරයකු විසින් මේ පනත යටතේ ඒ භාණ්ඩය තහනමට ගනු ලැබූ අවස්ථාවක දී, මේ පනතේ යම් විධිවිධානයක් හෝ මේ පනත යටතේ සාදන ලද යම් නියෝගයක් හෝ උල්ලංඝනය කර ඇති බවට ඒ බලධරයා සෑහීමට පත් වන්නේ නම් සහ ඒ භාණ්ඩයේ අයිතිකරු හෝ ඒ භාණ්ඩය තහනමට ගනු ලැබූ අවස්ථාවේ එහි සන්තකය දරූ තැනැත්තා හෝ ඒ භාණ්ඩය විනාශ කිරීමට ලිඛිත කැමැත්ත දෙන්නේ නම්, ඒ භාණ්ඩය විනාශ කිරීම නැතහොත් ඒ බලධරයා විසින් නියම කරනු ලබන පරිදි වෙනත් යම් ආකාරයකින් බැහැර කිරීම හෝ කරනු ලැබිය හැකි ය.

(2) එම භාණ්ඩය විනාශ කිරීමට එහි අයිතිකරු හෝ එහි සන්තකය දරන තැනැත්තා හෝ ලියවිල්ලකින් කැමැත්ත ප්‍රකාශ නොකරන අවස්ථාවක—

(අ) මේ පනතේ විධිවිධාන හෝ මේ පනත යටතේ සාදන ලද යම් නියෝගයක් හෝ ඒ භාණ්ඩය සම්බන්ධයෙන් උල්ලංඝනය කර නැති බවට බලධරයා සෑහීමට පත් වන්නේ නම් ඔහු විසින් ඒ භාණ්ඩය මුදා හැරිය යුතු ය; නැතහොත්

(ආ) මේ පනතේ යම් විධිවිධානයක් හෝ මේ පනත යටතේ සාදන ලද යම් නියෝගයක් හෝ උල්ලංඝනය කර ඇති බවට බලධරයා සෑහීමට පත් වන අවස්ථාවක, එම වරද කරන ලද්දේ යම් භාණ්ඩයක් සම්බන්ධයෙන් ද ඒ භාණ්ඩය තහනමට ගත් බව, ඒ බලධරයා විසින්, ඒ භාණ්ඩයේ අයිතිකරුට හෝ ඒ භාණ්ඩයේ සන්තකය දරන තැනැත්තාට දැනුම් දී, ඒ වරද සිදු කළ ප්‍රදේශය විෂයෙහි අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත්වරයාගේ අධිකරණය වෙත, නොපමාව දැන්විය යුතු ය.

(3) (2) (ආ) වන උපවගන්තිය යටතේ අධිකරණය වෙත තොරතුරු සැපයීමෙන් පසු—

(අ) ඒ භාණ්ඩයේ අයිතිකරු හෝ ඒ භාණ්ඩයේ සන්තකය දරන්නා හෝ මේ පනතේ යම් විධිවිධානයක් නැතහොත් මේ පනත යටතේ සාදන ලද යම් නියෝගයක් උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන්, නඩු විභාගයෙන් පසු, වරදකරු බව ඒ අධිකරණය විසින් තීරණය කරනු ලැබුවහොත් අධිකරණය විසින් නියම කරනු ලබන ආකාරයකට ඒ භාණ්ඩය බැහැර කරනු ලැබීම සඳහා ඒ භාණ්ඩය බලධරයා සන්තක කළ යුතු බවට ඒ අධිකරණය විසින් ආඥා කළ යුතු ය:

එසේ වුව ද වරද සිදුකළ තැනැත්තා කවරකුදැයි නොදන්නා හෝ සොයාගත නොහැකි හෝ අවස්ථාවක දී, ඒ උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් නඩු කටයුතු පැවරීමක් නොකර ම අධිකරණය විසින් ඒ භාණ්ඩය බලධරයා සන්තක කරනු ලැබිය යුතු ය.

(ආ) ඒ භාණ්ඩයේ අයිතිකරු හෝ එහි සන්තකය දරන තැනැත්තා හෝ මේ පනතේ යම් විධිවිධානයක් නැත හොත් මේ පනත යටතේ සාදන ලද යම් නියෝගයක් උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් වරදකරු නොවන බව නඩු විභාගයෙන් පසු අධිකරණය විසින් තීරණය කරනු ලැබුවහොත්, ඒ භාණ්ඩය ඒ අයිතිකරු වෙත හෝ එහි සන්තකය දරන තැනැත්තා වෙත මුදා හරින ලෙස ඒ අධිකරණය විසින් ආඥා කළ යුතු ය.

විශ්ලේෂණය.

16. (1) 15 (1) වන වගන්තිය යටතේ විනාශ කරනු ලැබුවේ නම් මිස, බලය ලත් නිලධරයකු විසින් තහනමට ගන්නා ලද යම් ආහාරයක් හෝ එහි යම් කොටසක් හෝ ඔහු විසින් ලබාගත් සැම්පලයක් හෝ විශ්ලේෂණය හා පරීක්ෂණය සඳහා, අනුමත රසපරීක්ෂකට ඉදිරිපත් කළ යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ තමා වෙත ඉදිරිපත් කරන ලද ආහාරයක් අනුමත රසපරීක්ෂක විසින් විශ්ලේෂණය හෝ පරීක්ෂණයට භාජනය කළ පසුව, තමාගේ විශ්ලේෂණයේ හෝ පරීක්ෂණයේ ප්‍රතිඵල දැක්වෙන සහතිකයක් හෝ වාර්තාවක් ඒ රසපරීක්ෂක විසින් අදාළ ආහාර බලධරයාට නිකුත් කළ යුතු ය.

(3) මේ වගන්තියේ කාර්යය සඳහා "අනුමත රසපරීක්ෂක" යන්නට අතිරේක අනුමත රසපරීක්ෂකයෙක් ද ඇතුළත් වේ.

අනුමත රසපරීක්ෂක.

17. (1) මේ පනතේ සහ එය යටතේ සාදන ලද යම් නියෝග වල කාර්ය සඳහා රජයේ රසපරීක්ෂකවරයා අනුමත රසපරීක්ෂකයා වන්නේ ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන කුමක් වුව ද පළාත් පාලන ආයතනයක යම් පරිපාලන ප්‍රදේශයක් සඳහා අතිරේක අනුමත රසපරීක්ෂකයකු අමාත්‍යවරයාට අනුමත කළ හැකි ය. එම අනුමතය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළ කළ යුතු ය.

(3) කිසිම තැනැත්තකු,—

(අ) නියමිත සුදුසුකම් ඔහු සතුව නොමැති නම්; හෝ

(ආ) ආහාර විකිණීමට සම්බන්ධ යම් කර්මාන්තයක හෝ ව්‍යාපාරයක කෙළින්ම හෝ අන් ලෙසකින් එම තැනැත්තා නිරතව සිටී නම් හෝ

අතිරේක අනුමත රසපරීක්ෂකයකු වශයෙන් අනුමත කරනු නොලැබිය යුතු ය.

## III වන කොටස

## නඩු කටයුතු

වැරදි.

18. (1) මේ පනතේ යම් විධිවිධානයක් හෝ එය යටතේ සාදන ලද යම් නියෝගයක් කඩ කරන හෝ උල්ලංඝනය කරන නැත හොත් මේ පනත යටතේ දෙන ලද යම් විධානයකට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරින සැම තැනැත්තෙක්ම වරදක් කරන අතර වරදකරු කරනු ලැබූ පසු පහත සඳහන් ආකාරයක දඬුවමකට යටත් වන්නේ ය:—

(අ) වරද මහජන සෞඛ්‍යයට හානි වන ආකාරයේ වූ වරදක් වන අවස්ථාවක මාස හයකට නොඅඩු සහ අවුරුදු තුනකට නොවැඩි කාලයකට බන්ධනාගාරගත කිරීම සහ රුපියල් දහසකට නොඅඩු සහ රුපියල් පන්දහසකට නොවැඩි දඩයක්;

(ආ) වරද 14 වන වගන්තියේ (5) වන උපවගන්තිය හෝ (9) වන උපවගන්තිය උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් වන අවස්ථාවක, මාස තුනකට නොඅඩු සහ අවුරුද්දකට නොවැඩි කාලයකට බන්ධනාගාරගත කිරීමට සහ රුපියල් පන්සියයකට නොඅඩු සහ රුපියල් දහසකට නොවැඩි දඩයක් ; සහ

(ඇ) වෙනත් යම් වරදක් ගැන වූ අවස්ථාවක—

(i) එම වරද ප්‍රථමවරට කරන ලද වරදක් නම්, රුපියල් දෙසිය පණහකට නොඅඩු සහ රුපියල් පන්සියය කට නොවැඩි දඩයක් හෝ මාස හයකට නොවැඩි කාලයකට බන්ධනාගාරගත කිරීම හෝ එකී දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකම;

(ii) එම වරද දෙවන වරට හෝ ඊට පසුව කරන ලද වර දක් නම්, මාස තුනකට නොඅඩු සහ අවුරුද්දකට නොවැඩි කාලයකට බන්ධනාගාරගත කිරීම සහ රුපියල් පන්සියයකට නොඅඩු සහ රුපියල් දහස කට නොවැඩි දඩයක්.

(2) මේ පනත යටතේ ව හෝ එය යටතේ සාදන ලද යම් නියෝග යටතේ වූ වරදක් සම්බන්ධයෙන් වරදකරු කරනු ලැබූ තැනැත්තකු, මේ පනත යටතේ වූ හෝ එය යටතේ සාදන ලද යම් නියෝග යටතේ වූ එවැනි හෝ ඊට සමාන ස්වභාවයක වරදක් සම්බන්ධයෙන් දෙවන වරට හෝ ඊට පසුව හෝ වරදකරු කරනු ලැබූ අවස්ථාවක, එසේ ඔහු දෙවන වරට හෝ ඊට පසුව හෝ වරද කරු කරන අධිකරණය විසින්—

(අ) වරද කරනු ලැබූ තැනැත්තාගේ නම සහ ලිපිනය ද වරද ද ඒ සඳහා නියම කරන ලද දඬුවම ද ඒ අධිකරණය විසින් නියම කරනු ලබන ප්‍රවෘත්ති පත්‍රයක හෝ වෙනත් ආකාරය කට හෝ ප්‍රසිද්ධ කර ඒ ප්‍රසිද්ධ කිරීමේ වියදම වරදකරු කරන ලැබූ තැනැත්තාට නියම කරන ලද දඩයක් වූ සේ වරදකරු කරනු ලැබූ තැනැත්තාගෙන් අය කරගත හැකි ය.

(ආ) ආහාර නිෂ්පාදනය කිරීම, ආනයනය කිරීම, සකස් කිරීම, ගබඩා කිරීම, විකිණීම හෝ බෙදා හැරීම සම්බන්ධයෙන් මේ පනත යටතේ හෝ වෙනත් යම් නීතියක් යටතේ වරදකරු කරනු ලැබූ තැනැත්තාට නිකුත් කරන ලද යම් බලපත්‍රයක් වේ නම් එය අවලංගු කර, අදාළ බලපත්‍ර නිකුත් කරන බලධරයාට ඒ බව දැනුම් දිය හැකි ය.

වරදක් කරනු ලබන තැනැත්තා වරෙන්තුවක් නොමැතිව සිර භාරයට ගනු ලැ[illegible] මෙන් ඔහුගේ නඩු විභාගය මහේස්ත්‍රාත් අධිකරණයක වි[illegible] පැවැත්වීමට[illegible] යුතු බව.

**19.** මේ පනත යටතේ වූ හෝ එය යටතේ සාදන ලද යම් නියෝග යටතේ වූ වරදක් කරන සෑම තැනැත්තකු ම වරෙන්තුවක් නොමැතිව සිරභාරයට ගනු ලැබිය හැකි අතර මේ පනත යටතේ වූ හෝ එය යටතේ සාදන ලද නියෝග යටතේ වූ සෑම වරදක් පිළිබඳව ම මහේස්ත්‍රාත් අධිකරණයක් විසින් නඩු විභාග කරනු ලැබිය යුතු ය.

නඩු කටයුතු පැවරීම.

**20.** (1) මේ පනත යටතේ වූ හෝ එය යටතේ සාදන ලද යම් නියෝගයක් යටතේ වූ හෝ වරදක් සම්බන්ධයෙන් නඩුවක් පැවරීම—

(අ) බලය ලත් නිලධරයකු විසින් මිස ; සහ

(ආ) ඒ වරද අනාවරණය කර ගත් දිනයේ සිට මාස තුනක කාල පරිච්ඡේදයක් ඉකුත් වීමෙන් පසුව හෝ

නොකළ යුතු ය.

(2) මේ පනත යටතේ වූ හෝ එය යටතේ සාදන ලද යම් නියෝගයක් යටතේ වූ වරදක් පිළිබඳ නඩු විභාගය පවත්වන අතර තුර යම් වේලාවක දී, අධිකරණය ඉදිරියට පත් කරනු ලැබූ සාක්ෂි අනුව වරදට චෝදනා ලැබ සිටින තැනැත්තා හැර වෙනත් යම් තැනැත්තකු වරද සිදුකිරීමෙහි ලා දැන දැනම සම්බන්ධ වී ඇති බවට අධිකරණය සෑහීමට පත් වූ අවස්ථාවක (1) (අ) උපවගන්තියේ විධිවිධාන කුමක් වුව ද, වරදට චෝදනා ලැබ සිටින තැනැත්තාට එරෙහිව ඇති චෝදනාව අස් කරගෙන එකී වෙනත් තැනැත්තට විරුද්ධව නඩුවක් පවරා ඇත්තාක් මෙන් එකී වෙනත් තැනැත්තාට විරුද්ධව කටයුතු කළ හැකි ය.

වෙනත් යම් තැනැත්තකු වරද කර ඇති බව චූදිතයා විසින් ඔප්පු කළ විට.

**21.** (1) මේ පනත යටතේ වූ වරදකට (මෙහි මින් මතු "චූදිතයා" යනුවෙන් සඳහන් කරනු ලබන) යම් තැනැත්තකුට විරුද්ධව චෝදනා නගා ඇති අවස්ථාවක, 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 136 වන වගන්තියෙහි විධිවිධානවලට අනුකූලව නිසි ලෙස වූ පැමිණිල්ලක් ඔහු විසින් කිරීමෙන් පසුව ද තමාගේ අදහස පිළිබඳව චෝදක පක්ෂයට දවස් තුනකට නොඅඩු කාලයකට පෙර දැන්වීමක් කිරීමෙන් පසුව ද, නියම වරදකරු යයි ඔහු විසින් චෝදනා කරනු ලබන වෙනත් යම් තැනැත්තකු අධිකරණය ඉදිරියට පමුණුවා ගැනීමට ඔහුට හිමිකම ලැබිය යුතු ය. තව ද වරද සිදු කළ බව ඔප්පු කරනු ලැබීමෙන් පසුව, වරද සිදු කිරීමට හේතුවූයේ එකී වෙනත් තැනැත්තාගේ ක්‍රියාවක් හෝ පැහැර හැරීමක් බවට චූදිතයා විසින් අධිකරණය සෑහීමට පත් කළහොත් එකී වෙනත් තැනැත්තා එම වරදට වරදකරු කළ යුතු අතර මේ පනතේ විධිවිධානවලට අනුකූලවනු පිණිස තමා නිසි සියලු උද්යෝගයෙන් ක්‍රියා කළ බව චූදිතයා තවදුරටත් ඔප්පු කළහොත් ඔහු වරදින් නිදොස් කළ යුතු ය.

(2) චූදිතයා (1) වන උපවගන්තියේ විධිවිධාන ප්‍රයෝජනයට ගැනීමට අදහස් කරන අවස්ථාවක—

(අ) චූදිතයා සාක්ෂි දෙන්නේ නම් චූදිතයාගෙන් සහ ඔහුගේ උත්තරවාද සනාථ කිරීම සඳහා ඔහු විසින් කැඳවනු ලැබූ යම් සාක්ෂිකරුවකුගෙන් හරස් ප්‍රශ්න ඇසීමේ ද සහ ඛණ්ඩන සාක්ෂි කැඳවීමේ ද අයිතිවාසිකම චෝදක පක්ෂයට ද නියම වරදකරු ලෙස චූදිතයා විසින් චෝදනා කරනු ලබන තැනැත්තාට ද හිමිවිය යුතු අතර ;

(ආ) නඩු කටයුත්තේ යම් පාර්ශ්වකරුවකු විසින් එහි වෙනත් යම් පාර්ශ්වකරුවකුට ගාස්තු ගෙවීම සම්බන්ධයෙන් සුදුසු යයි අධිකරණය විසින් අදහස් කරනු ලබන අන් දමේ ආඥාවක් අධිකරණය විසින් කළ හැකි ය.

(3) මේ පනත යටතේ නඩු කටයුතු ආරම්භ කළ හැකි වන්නේ මේ පනත යටතේ වූ යම් වරදක් සම්බන්ධයෙන් ද එවැනි වරදක් යම් තැනැත්තකු විසින් කර ඇති බව අදාළ ආහාර බලධරයට පෙනී ගියා වූ ද පැමිණිලි කරනු ලැබූ වරදට හේතුවූයේ වෙනත් යම් තැනැත්තකුගේ ක්‍රියාවක් හෝ පැහැර හැරීමක් බවට සහ පළමු සඳහන් තැනැත්තාට මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ විත්තිවාචකයක් තහවුරු කළ හැකි බවට බලධරයා සාධාරණව සෑහීමට පත්වූ ද අවස්ථාවක, පළමු කී තැනැත්තාට විරුද්ධව පළමුවෙන් නඩු කටයුතු ආරම්භ නොකර එකී වෙනත් තැනැත්තාට විරුද්ධව නඩු කටයුතු ආරම්භ කිරීමට බලධරයා විසින් සැලැස්විය හැකි ය.

එවැනි යම් නඩු කටයුත්තක දී, පළමු කී තැනැත්තාට, චෝදනා නැගිය හැකිව තිබුයේ යම් වරදක් සම්බන්ධයෙන් ද එම වරද සම්බන්ධයෙන් ම චූදිතයාට විරුද්ධව චෝදනා නැගිය හැකි අතර එම වරදට හේතුවූයේ චූදිතයාගේ ක්‍රියාවක් හෝ පැහැර හැරීමක් බව ඔප්පු කරනු ලැබූ විට එම වරදට ඔහු වරදකරු කරනු ලැබිය හැකි ය.

22. (1) මේ පනත යටතේ වූ හෝ එය යටතේ සාදන ලද නියෝග යටතේ වූ හෝ වරදක් සඳහා පවරන ලද යම් නඩුවක දී පහත සඳහන් යම් කාරණයක් ඔප්පු කිරීම චූදිතයා විසින් තමා වෙනුවෙන් ඉදිරිපත් කරනු ලබන විත්තිවාචකයක් වන්නේ ය— විත්තිවාචක.

(අ) ඔහු එම ආහාර, 6 වන වගන්තිය යටතේ ලිඛිත ප්‍රතිඥාහාරයක් තමා වෙත සැපයූ වෙනත් තැනැත්තකුගෙන් මිලට ගත් බව හා ඔහු එම ආහාර මිලට ගත් අවස්ථාවේ පැවති තත්ත්වයෙන් ම එම ආහාර විකුණූ බව ;

(ආ) එම ආහාර විකිණීම මේ පනත හෝ එය යටතේ සාදන ලද යම් නියෝග කඩ කිරීමක් වන බව සාධාරණ උද්‍යෝගයකින් කටයුතු කළත් ඔහුට දැනගත නොහැකි වූ බව ; හෝ

(ඇ) වෙළෙඳ දැන්වීමක් පළ කිරීම සඳහා වූ වරදක් සම්බන්ධයෙන් වූ විට, ඔහුට එම වෙළෙඳ දැන්වීම සාමාන්‍ය ව්‍යාපාරික කටයුතුවල දී ලැබෙන දැන්වීමක් වශයෙන් ලැබුණු බව හා තමා වරදක් සිදුකරන්නේ යයි විශ්වාස කිරීමට ඔහුට හේතුවක් නොවූ බව.

(2) බාල කළ ආහාර විකිණීමේ වරද හෝ මේ පනතේ විධිවිධානවලට හෝ එය යටතේ සාදන ලද නියෝගවලට පටහැනිව ආහාර විකිණීමේ වරද සඳහා වූ නඩුවක දී ඒ ආහාර බාල කළ ආහාර බව නොදැන සිටීම හෝ එම විකිණීම මේ පනතේ විධිවිධානවලට හෝ එය යටතේ සාදන ලද යම් නියෝගවලට හෝ පටහැනි බව නොදැන සිටීම හෝ ආහාර මිල දී ගත් තැනැත්තා විශ්ලේෂණය සඳහා ඒ

ආහාර මිලට ගත් නිසා එම විකිණීමෙන් ඒ තැනැත්තාට හානියක් නොවීම හෝ චූදිතයා විසින් තමා වෙනුවෙන් ඉදිරිපත් කළ හැකි විත්තිවාචකයක් නොවන්නේ ය.

අනුමත රසපරීක්ෂකගේ හෝ අතිරේක අනුමත රසපරීක්ෂකගේ වාර්තාව.

23. (1) පරීක්ෂණය හෝ විශ්ලේෂණය සඳහා අනුමත රස පරීක්ෂකයකුට හෝ අතිරේක අනුමත රස පරීක්ෂකයකුට ඉදිරිපත් කරන ලද යම් ද්‍රව්‍යයක් සම්බන්ධයෙන් වූ ඔහු විසින් අත්සන් කරන ලද බව සැලකෙන වාර්තාවක් හෝ සහතිකයක්, එහි සඳහන් කරුණු ගැන, ප්‍රතිවිරුද්ධ තත්ත්වය ඔප්පු කිරීමට සාක්ෂි නැති විටෙක, ප්‍රමාණවත් සාක්ෂි වන්නේ ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් වාර්තාව හෝ සහතිකය යම් පාර්ශ්වකරුවකුට විරුද්ධව ඉදිරිපත් කරනු ලැබ, අවශ්‍යාවෝචිත පරිදි, අනුමත රස පරීක්ෂක හෝ අතිරේක අනුමත රස පරීක්ෂක සාක්ෂිකරුවකු වශයෙන් කැඳවිය යුතු යයි එකී පාර්ශ්ව කරු විසින් ඉල්ලා සිටින අවස්ථාවක දී, ඔහු කැඳවීමේ වියදම එම පාර්ශ්වකරු විසින් අධිකරණයට ගෙවූ පසු, අධිකරණය විසින් ඔහු කැඳවිය යුතු අතර ඔහුගෙන් සාක්ෂි ගැනීම ද කළ යුතු ය.

(3) (1) වන උපවගන්තියේ සඳහන් වාර්තාව හෝ සහතිකය ඉදිරිපත් කරන පාර්ශ්වකරු විසින්, එම වාර්තාව හෝ සහතිකය ඉදිරිපත් කිරීමට අදහස් කරනු ලැබ ඇත්තේ යම් පාර්ශ්වකරුවකුට විරුද්ධව ද, ඒ පාර්ශ්වකරුට එහි පිටපතක් දී ඇත්නම් ද එම වාර්තාව හෝ සහතිකය ඉදිරිපත් කිරීමට තමා අදහස් කරන බවට සාධාරණ කාලයක දැනුම්දීමක ඇත්නම් ද මිස, එකී වාර්තාව හෝ සහතිකය සාක්ෂි වශයෙන් භාර නොගත යුතු ය.

බලයලත් නිලධරයා වෙත රඳවා ගත් සැම්පලයේ කොටස ඔහු විසින් අධිකරණයට ඉදිරිපත් කළ යුතු බව.

24. (1) බලය ලත් නිලධරයකු විසින් ලබාගත් සැම්පලයක් ඔහු විසින් කොටස්වලට බෙදිය යුතුව තිබූ විටෙක දී එයින් එක් කොටසක් ඔහු වෙත රඳවා ගත යුතු අතර, එසේ ඔහු රඳවා ගත් කොටස ඒ සැම්පලය සම්බන්ධයෙන් නඩු පවරන වේලාවේ දී අධිකරණය වෙත ඉදිරිපත් කළ යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද සැම්පලයේ කොටස එම සැම්පලයේ වෙනත් යම් කොටසක් පරීක්ෂා කර හෝ විශ්ලේෂණය කර ඇති රස පරීක්ෂකයකුට හැර වෙනත් අනුමත රස පරීක්ෂකයකුට හෝ අතිරේක අනුමත රස පරීක්ෂකයකු වෙත පරීක්ෂණය හා විශ්ලේෂණය සඳහා, මහේස්ත්‍රාත්වරයා විසින් තම මෙහෙයීමෙන්ම ඉදිරිපත් කළ හැකි අතර නඩුවේ යම් පාර්ශ්වකරුවකු විසින් ඉල්ලා සිටියහොත් එය එසේ පරීක්ෂණය හා විශ්ලේෂණය සඳහා ඉදිරිපත් කළ යුත්තේ ය.

(3) (2) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරනු ලැබූ සැම්පලයේ කොටස ලත් රස පරීක්ෂක විසින්, එය ඔහුට ලැබී දින විසි අටක් ඇතුළත එම සැම්පලයේ කොටස ගැන ඔහුගේ වාර්තාව හෝ සහතිකය අධිකරණයට යැවිය යුතු ය.

(4) විශ්ලේෂණයේ හෝ පරීක්ෂණයේ වියදම අධිකරණය විසින් විධාන කරනු ලබන පාර්ශ්වකරු විසින් ගෙවිය යුතු ය.

**25.** බලයලත් නිලධරයකු විසින් 14 (1) (ඇ) වගන්තිය යටතේ යම් පොතකින්, ලේඛනයකින් හෝ වෙනත් වාර්තාවකින් ලබා ගත් පිටපතක් හෝ උද්ධෘතයක්, එය සැබෑ පිටපතක් හෝ උද්ධෘතයක් බවට ඒ බලයලත් නිලධරයා විසින් සහතික කරනු ලැබුව හොත්, එම පොත, ලේඛනය හෝ වාර්තාව තබා ගන්නා හෝ පවත්වාගෙන යන නැතහොත් තබා ගැනීමට හෝ පවත්වා ගෙන යාමට සලස්වන තැනැත්තාට විරුද්ධව සාක්ෂි වශයෙන් ආවේශ්‍ය විය යුතු අතර, එය එම පොතේ, ලේඛනයේ හෝ වාර්තාවේ අඩංගු දේ පිළිබඳ බැලූ බැල්මට පිළිගත හැකි සාක්ෂියක් ද වන්නේ ය.

බලයලත් නිලධරයකු විසින් ලබාගත් ලේඛනයක පිටපත හෝ උද්ධෘතය.

**26.** (1) ප්‍රතිවිරුද්ධ තත්ත්වය ඔප්පු කරනු ලබන තුරු, මේ පනතේ හෝ එය යටතේ සාදන ලද යම් නියෝගවල කාර්ය සඳහා පහත සඳහන් පූර්ව නිගමන කරනු ලැබිය යුතු ය :—

පූර්ව නිගමන.

(අ) සාමාන්‍යයෙන් මනුෂ්‍ය පරිභෝජනය සඳහා භාවිත කරනු ලබන යම් ආහාරයක් විකුණනු ලැබුවහොත් හෝ විකිණීම සඳහා ඉදිරිපත් කරනු, ප්‍රදර්ශනය කරනු හෝ තබාගනු ලැබුවහොත් එය මනුෂ්‍ය පරිභෝජනය සඳහා විකිණීමට අදහස් කර තිබූ දෙයක් ලෙස පූර්ව නිගමනය කිරීම ;

(ආ) යම් ආහාරයක් නිෂ්පාදනය කිරීම, පරිරක්ෂණය කිරීම, ඇසිරීම, සකස් කිරීම, ගබඩා කිරීම හෝ විකිණීම සඳහා ප්‍රයෝජනයට ගනු ලබන ස්ථානයක තිබී සොයා ගනු ලබන, සාමාන්‍යයෙන් මනුෂ්‍ය පරිභෝජනය සඳහා භාවිත කරනු ලබන යම් ආහාරයක්, මනුෂ්‍ය පරිභෝජනය සඳහා විකිණීමට ඇති ආහාර සකස් කිරීම හෝ ඒ ආහාර වලට මිශ්‍ර කිරීම සඳහා යොදා ගැනීමට අදහස් කර තිබූ භාණ්ඩයක් ලෙස පූර්ව නිගමනය කිරීම ; සහ

(ඇ) ආහාර සකස් කිරීම සඳහා ප්‍රයෝජනයට ගනු ලබන ස්ථානයක තිබී සොයා ගනු ලබන්නා වූ ද ආහාර සංයුතියේ දී හෝ ආහාර සකස් කිරීමේ දී යොදා ගත හැකි වූ ද යම් ද්‍රව්‍යයක්, මනුෂ්‍ය පරිභෝජනය සඳහා වූ ආහාර සංයුතියේ දී හෝ සකස් කිරීමේ දී යොදා ගැනීමට අදහස් කර තිබූ ලෙස පූර්ව නිගමනය කිරීම.

(2) බාල කළ ආහාර නිපදවීමේ වරද සඳහා වූ නඩුවක දී—

(අ) වෙනත් යම් ද්‍රව්‍යයක් එකතු කිරීමෙන් එම ආහාර බාල කර තිබූ බව ; සහ

(ආ) එකී වෙනත් ද්‍රව්‍යය චූදිතයා සන්තකයේ හෝ චූදිතයාගේ ස්ථානයේ තිබූ බව

ඔප්පු කරනු ලැබුව‍හොත්, චූදිතයා විසින් එකී වෙනත් ද්‍රව්‍යය මිශ්‍ර කිරීමෙන් ඒ ආහාර බාල කළ බව, ඊට ප්‍රතිවිරුද්ධ තත්ත්වය ඔප්පු කරනු ලබන තෙක්, පූර්ව නිගමනය කළ යුතු ය.

(3) යම් ආහාරයක් අඩංගු ඇසුරුමක් තුළ හෝ ඒ මත එය නිෂ්පාදනය කළ හෝ ඇසුරූ තැනැත්තාගේ නම සහ ලිපිනය වශයෙන් සැලකෙන නම සහ ලිපිනය ඇති අවස්ථාවක, ඒ නම සහ

ලිපිනය අයිති තැනැත්තා විසින් ඒ ආහාරය, අවස්ථාවෝචිත පරිදි, නිෂ්පාදනය කළ හෝ ඇසුරු බව, ඊට ප්‍රතිවිරුද්ධ තත්ත්වය ඔප්පු කරනු ලබන තෙක්, පූර්ව නිගමනය කරනු ලැබිය යුතු ය.

පුද්ගල මණ්ඩලයක් විසින් කරනු ලබන වැරදි.

27. මේ පනත යටතේ වූ හෝ එය යටතේ සාදන ලද යම් නියෝග යටතේ වූ වරදක් පුද්ගල මණ්ඩලයක් විසින් කරන ලද අවස්ථාවක—

(අ) එම පුද්ගල මණ්ඩලය සංස්ථාගත කළ මණ්ඩලයක් නම්, එම වරද සිදු කරන ලද අවස්ථාවේ ඒ මණ්ඩලයේ අධ්‍යක්ෂවරයකු, සාමාන්‍යාධිකාරී, ලේකම් හෝ ඊට සමාන වෙනත් නිලධරයකුව සිටි සෑම තැනැත්තකු ද ; එසේ නැතහොත්

(ආ) එම මණ්ඩලය සංස්ථාගත කළ මණ්ඩලයක් නොවේ නම්, එම වරද සිදු කරන ලද අවස්ථාවේ ඒ මණ්ඩලයේ සාමාජිකයකුව සිටි සෑම තැනැත්තකු ද

එම වරද ඔහුගේ කැමැත්ත හෝ එකඟත්වය නොමැතිව සිදු කළ බව ද ඔහුගේ කාර්යවල ස්වභාවය සැලකිල්ලට ගෙන බලන විට එම වරද සිදු කිරීම වැළැක්වීම සඳහා ඔහු විසින් අවස්ථානුගත කරුණු අනුව දැක්විය යුතු සියලු උද්යෝගය ඔහු විසින් දැක්වූ බව ද ඔහු ඔප්පු කළහොත් මිස එම වරදට වරදකරු ලෙස සලකනු ලැබිය යුතු ය.

## IV වන කොටස

## පොදු විධිවිධාන

සද්භාවයෙන් කරන ලද ක්‍රියා සඳහා ආරක්ෂාව.

28. මේ පනත යටතේ හෝ එය යටතේ සාදන ලද යම් නියෝග යටතේ තමා විසින් සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි සැලකෙන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් යම් තැනැත්තකුට විරුද්ධව කිසිම සිවිල් නඩුවක්, අපරාධ නඩුවක් හෝ වෙනත් නඩු කටයුත්තක් නොපැවරිය යුත්තේ ය.

සමහර දඩ මුදල් පළාත් පාලන ආයතනවල අරමුදල්වලට ගෙවිය යුතු බව.

29. බලයලත් නිලධරයකු විසින් හෝ පළාත් පාලන ආයතනයක වත්තාවූ ආහාර බලධරයකු විසින් හෝ පවරන ලද නඩුවක දී මේ පනත යටතේ වූ හෝ එය යටතේ සාදන ලද යම් නියෝග යටතේ වූ වරදක් සම්බන්ධයෙන් ගෙවන ලද හෝ අය කර ගන්නා ලද සියලු දඩ මුදල් ඒ පළාත් පාලන ආයතනයේ අරමුදල්වලට බැර කළ යුතු ය.

ආහාර විෂවීම ගැන දැනුම්දීම.

30. යම් පළාත් පාලන ආයතනයක පරිපාලන ප්‍රදේශය තුළ තමාගේ වෘත්තිය කරගෙන යන සෑම වෛද්‍ය වෘත්තිකයකු විසින් ම, එම ප්‍රදේශය ඇතුළත ඔහු දන්නා සියලු ආහාර විෂවීමේ අවස්ථා ගැන ඒ ප්‍රදේශයේ සෞඛ්‍ය සේවා අධිකාරිවරයාට හෝ සෞඛ්‍ය වෛද්‍ය නිලධරයාට වාර්තා කළ යුතු ය.

ආහාරවලට වෙනත් ලිඛිත නීති අදාළවීම.

**31.** (1) සුරා බදු ආඥාපනතේ අර්ථානුකූලව සුරා බද්දට යටත් භාණ්ඩ වන ආහාරවලට අදාළව මේ පනතේ විධිවිධාන හෝ එය යටතේ සාදන ලද යම් නියෝග සුරා බදු ආඥාපනතේ විධිවිධාන වෙනුවෙන් ආදේශ කිරීම සඳහා නොව ඒවාට අතිරේක වශයෙන් වන්නේ ය.

(2) යම් ආහාර ආනයනය කිරීමට අදාළව මේ පනතේ විධිවිධාන හෝ එය යටතේ සාදන ලද යම් නියෝග ක්‍රියාත්මක කිරීමේ සහ ඒවා උල්ලංඝනය කිරීම හෝ උල්ලංඝනය කිරීමට තැත් කිරීම වැළැක්වීමේ සහ ඒ උල්ලංඝනය කිරීම හෝ උල්ලංඝනය කිරීමට තැත් කිරීම සඳහා දඬුවම් කිරීමේ කාර්යය සම්බන්ධයෙන් රේගු ආඥාපනතේ විධිවිධාන අදාළ වන්නේ ය.

(3) මේ පනත යටතේ ආනයනය කිරීම තහනම් කරනු ලැබ ඇති යම් ආහාරයකට රේගු ආඥාපනත අදාළ කිරීමේ කාර්යය සඳහා, ඒ ආඥාපනත යටතේ ආනයනය කිරීම තහනම් කරනු ලැබ ඇති බඩු වශයෙන් එම ආහාරය සලකනු ලැබිය යුතු ය.

(4) මේ පනත යටතේ සාදන ලද නියෝග හා යම් ලිඛිත නීතියක් යටතේ යම් පළාත් පාලන ආයතනයක් විසින් සාදන ලද අතුරු ව්‍යවස්ථා අතර ඝට්ටනයක් හෝ අනනුකූලතාවක් ඇති වුවහොත් මේ පනත යටතේ සාදන ලද නියෝග බල පැවැත්විය යුතු ය.

නියෝග.

**32.** (1) නියම කළ යුතු යයි මේ පනතින් නියමිත කරුණු සම්බන්ධයෙන් හෝ නියෝග සෑදීමට බලය දී ඇති කරුණු සම්බන්ධයෙන් හෝ අමාත්‍යවරයා විසින් නියෝග සෑදිය හැකි අතර, විශේෂයෙන් ම, පහත දැක්වෙන කරුණු සියල්ලම හෝ ඉන් කිසිවක් හෝ සම්බන්ධයෙන්, අමාත්‍යවරයා විසින්, ආහාර උපදේශක කමිටුව විමසා, නියෝග සෑදිය හැකි ය :—

(අ) යම් ආහාරයක හෝ යම් ආහාර පංතියක, යම් කිසි නියමිත ද්‍රව්‍යයක් හෝ නියමිත පංතියකට අයත් යම් ද්‍රව්‍යයක් ඇති විට හෝ ඊට එකතු කරනු ලැබ හෝ එයින් ඉවත් කරනු ලැබ හෝ එයින් අඩු කර හෝ ඇති විට, ඒ ආහාර හෝ ආහාර පංතිය බාල කළ ආහාර වන බව ප්‍රකාශ කිරීම ;

(ආ) විකිණීම සඳහා ආහාර ලේබල් කිරීම, ඇසිරීම, ඉදිරිපත් කිරීම, තැබීම හෝ ප්‍රචාරය කිරීම ;

(ඇ) ආහාර ඇසුරුම්වල ප්‍රමාණය, ඒවායේ දිග, පළල ආදිය, ඒවා පුරවන ආකාරය සහ වෙනත් පිරිවිතර ;

(ඈ) යම් ආහාර විකිණීම හෝ විකිණීමේ කොන්දේසි ;

(ඉ) යම් ආහාරයක ප්‍රමාණය, ස්වභාවය, වටිනාකම, සංශුතිය හෝ ආරක්ෂා සහිත භාවය සම්බන්ධයෙන් පාරිභෝගිකයා හෝ මිල දී ගන්නා රැවටීමෙන් හෝ නොමඟ යැවීමෙන් වැළැක්වීම සඳහා හෝ පාරිභෝගිකයාට හෝ මිල දී ගන්නාගේ සෞඛ්‍යයට හානියක් සිදුවීම වැළැක්වීම සඳහා එම ආහාරයේ මිශ්‍රණ ද්‍රව්‍යයක් වශයෙන් යම් ද්‍රව්‍යයක් භාවිත කිරීම :

(ඊ) ආහාරවල සංශුතිය, පිරිසිදු බව, ගුණය හෝ වෙනත් ගුණාංග පිළිබඳ වූ ප්‍රමිති ;

(ඩ) පනතට හෝ එය යටතේ සාදන ලද යම් නියෝගවලට අනු කූලවීම සහතික කෙරෙනු පිණිස ආහාර ආනයනය කිරීම ;

(ඪ) පාරිභෝගිකයාගේ හෝ මිල දී ගන්නාගේ සෞඛ්‍යාරක්ෂාව තකා හෝ ඔහුගේ සෞඛ්‍යයට හානියක් වීම වැළැක්වීම සඳහා යම් ආහාරයක් සකස් කිරීමේ, නිෂ්පාදනය කිරීමේ, පරිරක්ෂණය කිරීමේ, ඇසිරීමේ, ගබඩා කිරීමේ සහ පරීක්ෂණයට භාජන කිරීමේ ක්‍රමය ;

(ණ) (i) මේ පනත යටතේ බලපත්‍ර ප්‍රදානය කිරීම හෝ ප්‍රතික්ෂේප කිරීම හෝ කරනු ලබන්නේ කවර තැනැත්තකුට ද කවර පරිවේෂණ යටතේ ද සහ කුමන නියමයන් හා කොන්දේසි යටතේ ද යන වග ;

(ii) මේ පනත යටතේ බලපත්‍ර සඳහා වූ ඉල්ලීම් ඉදිරිපත් කළ යුතු හා ඒ ඉල්ලීම් පිළිබඳව කටයුතු කළ යුතු ආකාරය සහ පිළිවෙළ ; සහ

(iii) බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා ගෙවිය යුතු ගාස්තුව ;

(ත) මේ පනත හෝ එය යටතේ සාදන ලද නියෝග නිසි ලෙස ක්‍රියාත්මක කිරීම සහ එහි නිසි කාර්ය පරිපාලනය සඳහා අවශ්‍ය යයි අමාත්‍යවරයා සලකන තොරතුරු සපයන ලෙසත් එසේ අවශ්‍ය යයි සලකන පොත් සහ වාර්තා තබා ගන්නා ලෙසත් යම් ආහාරයක් නිෂ්පාදනය කරන හෝ විකුණන තැනැත්තන්ට නියම කිරීම ;

(ථ) බලයලත් නිලධරයන්ගේ, අනුමත රස පරීක්ෂකගේ සහ අතිරේක අනුමත රස පරීක්ෂකයන්ගේ බලතල සහ කාර්ය සහ 14 වන සහ 15 වන වගන්තිවල අර්ථානුකූලව සැම්පල් ගැනීම සහ භාණ්ඩ තහනම් කිරීම, රඳවා ගැනීම හෝ අහිමි කිරීම සහ බැහැර කිරීම ;

(ද) මේ පනතේ සහ එය යටතේ සාදන ලද යම් නියෝගවල කාර්ය සඳහා භාවිත කළ යුතු ආකෘතිපත්‍ර ;

(ධ) යම් ආහාරයක් විශ්ලේෂණය කිරීම හෝ පරීක්ෂණයට භාජන කිරීම, ඒ ආහාරවල සැම්පල් ගැනීමේ කාර්ය පටිපාටිය සහ ඒ ආහාර විශ්ලේෂණය හෝ පරීක්ෂණයට භාජන කිරීම සඳහා ගෙවිය යුතු ගාස්තු ප්‍රමාණය ; සහ

(න) යම් බාල කළ ආහාරයක් විකිණීම සහ විකිණීම සඳහා ප්‍රවාහනය කිරීම සම්බන්ධයෙන් වූ තහනම් සහ සීමා කිරීම්.

(2) අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර එය එසේ පළ කරනු ලැබූ දිනයේ හෝ ඒ නියෝගයේ නියමිත යම් පසු දිනයක හෝ ක්‍රියාත්මක විය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක් ම එය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ පසු හැකි ඉක්මනින් අනුමතය සඳහා පාර්ලිමේන්තුව ඉදිරියේ තැබිය යුතු ය.

(4) එසේ අනුමත නොකරනු ලැබූ යම් නියෝගයක්, ඒ අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සැලකිය යුතු ය. එහෙත් එය යටතේ ඊට කලින් කරන ලද කිසිවකට ඉන් හානියක් නොවිය යුතු ය.

(5) එසේ එම නියෝගය පරිච්ඡින්න කරනු ලැබූ දිනය ලෙස සැලකිය යුතු දිනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

33. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ පනතෙහි— අර්ථ නිරූපණය.

"ආහාර" යන්නෙන් මනුෂ්‍යයන්ගේ ආහාර හෝ පාන වශයෙන් ප්‍රයෝජනයට ගැනීම සඳහා නිෂ්පාදනය කළ, විකුණූ හෝ නිරූපිත යම් භාණ්ඩයක් අදහස් වන අතර ආහාර සංයුති යේ දී හෝ ආහාර පිළියෙල කිරීමේ දී සාමාන්‍යයෙන් ගනු ලබන හෝ යොදාගනු ලබන යම් භාණ්ඩයක් ද ඊට ඇතුළත් වේ;

"ඇසුරුම" යන්නට යම් ආහාරයක් සම්පූර්ණයෙන් ම හෝ ඉන් කොටසක් අඩංගුව, තබා හෝ ඇසුරා ඇත්තේ යම් දෙයක් තුළ ද ඒ දෙය ඇතුළත් වේ;

"නිෂ්පාදනය" යන්නෙන් යම් ආහාරයක් වෙළෙඳාම සඳහා සකස් කිරීම අදහස් වන අතර සාමාන්‍ය සිල්ලර වෙළෙඳ කටයුතු වල දී ආහාර ඇසිරීම හැර ආහාර සෑදීම, වෙනස් කිරීම, නිමහම් කිරීම, ඇසිරීම, ලේබල් කිරීම හෝ වෙනත් ආකාරයකින් පදම් කිරීම සඳහා වූ යම් ක්‍රියාවලියක් හෝ ක්‍රියාවලියක කොටසක් ඊට ඇතුළත් වේ;

"වෛද්‍ය වෘත්තිකයා" යන්නෙහි, වෛද්‍ය ආඥාපනතෙහි ඊට දී ඇති අර්ථය ම ඇත;

"පළාත් පාලන ආයතනය" යන්නෙන් මහ නගර සභාවක්, නගර සභාවක්, සුළු නගර සභාවක් හෝ ගම් සභාවක් අදහස් වන අතර ඒ යම් සභාවක් විසින් ක්‍රියාත්මක කරන හා ඉටු කරන බලතලවලට, කාර්යවලට සහ කර්තව්‍ය වලට අනුරූප වන්නා වූ හෝ සමාන වන්නා වූ බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම සඳහා යම්කිසි නීතියකින් හෝ නීතියක් යටතේ හෝ ඇති කොට පිහිටුවන ලද කවර වූ හෝ අධිකාරයක් ඊට ඇතුළත් වේ;

"ප්‍රචාරය කිරීම" යන්නට, යම් ආහාරයක් විකිණීම හෝ බැහැර කිරීම කෙලින් ම හෝ අන්‍ය ආකාරයකින් හෝ වැඩි කිරීමේ කාර්යය සඳහා කවර හෝ අයුරෙකින් කෙරෙන කරුණු පෙන්නුම් කිරීමක් ඇතුළත් වේ;

"බාලකළ" යන්නෙන්,—

(අ) යම් ආහාරයක් සෞඛ්‍යයට හානිකර බවට පත් වන පරිදි, හෝ

(ආ) යම් ආහාරයක ස්වභාවය, වටිනාකම, සංයුතිය, ගුණය හෝ ප්‍රවේසම් සහිත භාවය කෙරෙහි බලපාන පරිදි හෝ

මිශ්‍රණ ද්‍රව්‍යයක් වශයෙන් යම් ද්‍රව්‍යයක් එම ආහාරය පිළියෙල කිරීමේ දී එකතු කිරීම හෝ ඒ ආහාරයෙන් යම් සංඝටකයක් ඉන් අඩු කිරීම හෝ ඒ ආහාරය වෙනත් ක්‍රියාවලියකට හෝ වෙනත් සැකසීමකට භාජන කිරීම අදහස් වේ;

"රජයේ රස පරීක්ෂක" යන්නෙන් රජයේ රස පරීක්ෂක ධුරය තත් කාලයේ දරන තැනැත්තා අදහස් වන අතර 8 වන වගන්තියේ කාර්ය සඳහා හැර, අතිරේක, නියෝජ්‍ය, ජ්‍යෙෂ්ඨ සහකාර හෝ සහකාර හෝ සහකාර රජයේ රස පරීක්ෂක ධුරය තත් කාලයේ දරන යම් තැනැත්තෙක් ද ඊට ඇතුළත් වේ;

"ලේබලය" යන්නට ආහාර අඩංගු භාජනයකට ඇමුණු, වැග් කැබැල්ලක්, ඟනයක්, ලකුණක් හෝ ආහාර අඩංගු භාජනයක් මත චිත්‍රයක් මගින් හෝ ලියූ, මුද්‍රණය කළ, හැඩ අච්චු ගැසූ, ලකුණු කළ, එම්බොස් කළ හෝ ඔබ්බන ලද වෙනත් විස්තරයක් හෝ ඇතුළත් වේ;

"ලේබල් කිරීම" යන්නට යම් ආහාරයක් සම්බන්ධයෙන් වූ හෝ ආහාරය කැටුව වූ ලේබලයක් ද යම් ලිඛිත, මුද්‍රිත හෝ ප්‍රස්තාරික දෙයක් ද ඇතුළත් වේ;

"විකිණීම" යන්නෙන් තොග වශයෙන් වුව ද සිල්ලරට වුව ද මුදලට හෝ ණයට හෝ හුවමාරුවට හෝ විකිණීම අදහස් වේ;

"ස්ථානය" යන්නට යම් ආහාරයක් විකුණන හෝ විකිණීම සඳහා නිෂ්පාදනය කරන හෝ විකිණීම සඳහා ගබඩා කර තබා ඇති සාප්පුවක්, කඩපිලක් හෝ ස්ථානයක් ඇතුළත් වේ;

"අදාළ ආහාර බලධරයා" යන්නෙන් 10 වන වගන්තිය යටතේ පත් කරනු ලැබූ ආහාර බලධරයකු අදහස් වේ;

"සනීපාරක්ෂාවට අහිතකර තත්ත්වයක්" යන්නෙන්, දූවිලි, කුණු හෝ කසලවලින් ආහාර අපවිත්‍ර වීමට හෝ ආහාර සෞඛ්‍යයට හානිකර වීමට හෝ ඉඩ ලැබෙන තත්ත්වයක් හෝ අවස්ථාගත කරුණු අදහස් වේ; සහ

"පශු වෛද්‍යවරයා" යන්නෙන් 1956 අංක 46 දරන පශු වෛද්‍යවරයන්ගේ සහ වෘත්තිකයන්ගේ පනත යටතේ පශු වෛද්‍යවරයකු හෝ පශු වෘත්තිකයකු වශයෙන් ලියාපදිංචි වී ඇති තැනැත්තකු අදහස් වේ.

ඉවත් කිරීම සහ අත් හැරීම.

34. (1) ආහාර සහ ඖෂධ පනත (216 වන අධිකාරය) මෙයින් ඉවත් කරනු ලැබේ.

(2) ආහාර සහ ඖෂධ පනත ඉවත් කරනු ලැබුව ද ආහාර බාල කිරීම වැළැක්වීම සඳහා එම පනත යටතේ සාදනු ලැබ මේ පනත ක්‍රියාත්මක වන තෙක් වලංගුව පැවති නියෝග මේ පනත යටතේ සාදන ලද නියෝග මගින් වෙනස් කරන, සංශෝධනය කරන හෝ පරිච්ඡින්න කරන තුරු එම නියෝග මේ පනතේ විධිවිධානවලට අනනුකූල නොවන අවස්ථාවල දී සහ ඒ තාක් දුරට දිගටම බල පැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 30 කි. (විදේශීය) රු. 40 කි. කොළඹ 1 තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය. මුදල් ගෙවූ දිනට කලින් නිකුත් කරන ලද පනත් කෙටුම්පත් සහ නීති නොසැපයීමේ කොන්දේසිය මත පමණද දායක මුදල් භාරගනු ලැබේ.